රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 13/89

(13)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1989 මාර්තු මස 1 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

වයස අවුරුදු 60 ට එළඹීමෙන් විශ්‍රාම ගන්නා
රජයේ නිලධාරියෙකුට වැටුප් වර්ධකය ගෙවීම

සිය වැටුප් ක්‍රමයේ උපරිම වැටුප් තලයට පැමිණ නැති සහ වයස අවුරුදු 60 ට එළඹීමෙන් විශ්‍රාම ගන්නා රජයේ නිලධාරියෙකුට ඔහුගේ වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායක නම්, විශ්‍රාම වැටුප් ගණනය කිරීම සඳහා ඔහු උපයාගත් වැටුප් වර්ධකය (එනම් පසුගිය වැටුප් වැඩිවීමේ දිනයේ සිට විශ්‍රාම ගන්නා දිනට පෙර දින දක්වා වූ කාලයට අනුපාත වැටුප් වැඩිවීම) ඔහු අවසාන වරට ලැබූ වැටුපට එකතු කිරීමට ඉඩදිය යුතුය.

(සිරිල් ගමගේ)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.